
විශිෂ්ට 5 Path English Method යටතේ
පාසල් සිසුන් හා වැඩිහිටි අය වෙනුවෙන් පවත්වන
5 Path Web English Certificate පාඨමාලාව
Unit 01
පැය 14 කට වඩා ඇති පළමු Unit 04
වටිනා නිබන්ධන 05 ක් ලබාගෙන
5 Path English Method Youtube ඔස්සේ හෝ
5pathenglishmethod.lk වෙබ් අඩවිය ඔස්සේ
ඔබත් නොමිලේ ඉගෙනගන්න.
076 25 31 540 / 071 43 67 263
5pathenglishmethodkw@gmail.com
5 Path English Method
5 Path English Method
5pathenglishmethod.lk
මෙහෙයවීම 5 Path English Method හි නිර්මාතෘ ප්‍රවීණ ඉංග්‍රීසි දේශක,
Kithsiri Wisanperuma
B.Sc (Mgt) English medium, Inventor, Author,
Teacher-Trainer, Well – Experienced English Tutor.

# 01. ඉංග්‍රීසි ඉගැන්වීමේ නව ක්‍රමවේදයක ජාතික අවශ්‍යතාවය

පෙර කිසිදා නොවූ විරූ ලෙස, කෙනෙකුට තම අනාගතය ගොඩනගා ගැනීමට ඉංග්‍රීසි භාෂාමය දැනුම අත්‍යාවශ්‍ය වී ඇති යුගයකයි අපි දැන් සිටින්නේ. රටේ පවතින සමාජ ආර්ථික කටයුතු හා එහි ඉදිරි ගමන දෙස බලන විට එම අවශ්‍යතාවය දිනෙන් දින ඉහළ යමින් පවතින බව ද පෙනෙන්නට ඇත.

මෙම භාෂාමය අවශ්‍යතාවයෙන් දරුවන් ව පෝෂණය කිරීමට රජය අතිවිශාල මුදල් ප්‍රමාණයක් වැය කරමින් පාසල් කාලය තුළ වසර 10 ක් පමණ හා ඉන් අනතුරුව විශ්වවිද්‍යාල කාලය තුළ තවත් වසර 4 ක් පමණ රාජ්‍ය යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කළත්, එය අසාර්ථක වී ඇති බව ඉතා පැහැදිළි ය. එබැවින් මෙම ජාතික අවශ්‍යතාවය දරුවන් වෙනුවෙන් ඉටුකර දීමේ නාමයෙන් බිහි වී ඇති පෞද්ගලික අධ්‍යාපන ක්ෂේත්‍රය වෙනුවෙන් ද වසර 15 ක් 20 ක් පමණ දෙමව්පියන්ට හා දරුදැරියන්ට ඔවුන්ගේ වටිනා කාලය හා මුදල් වැය කිරීමට සිදු වී ඇත.

වසර 15 ක් 20 ක් උත්සාහ කළත් මෙම අංශ දෙක මගින් ම අති බහුතරයක් දෙනෙකුට තම ඉංග්‍රීසි භාෂාමය අවශ්‍යතාවය සපුරාගැනීමට නොහැකි වී ඇත්තේ අපේ රටේ ඉංග්‍රීසි උගන්වන ක්‍රමවේදය අපේ රටට නොගැළපෙන බැවිනි. (කෙනෙක් තම මව් භාෂාව ඉගෙන ගන්නා ආකාරය හා දෙවන භාෂාවක් ඉගෙන ගන්නා ආකාරය එකිනෙකට වෙනස් බැවින් කිසියම් ජාතියක් තම මව් භාෂාව ලෙස භාෂාවක් ඉගෙන ගන්න භාවිතා කරන ක්‍රමවේදයන් එම භාෂාවම දෙවන භාෂාවක් ලෙස ඉගෙන ගන්නා අයට කිසිසේත්ම නොගැළපේ. අපේ රටේ ඇත්තේ ඉංග්‍රීසි ජාතිකයින් තම මව් භාෂාව ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගෙනගැනීමට භාවිතා කරන ක්‍රමයයි. එම ක්‍රමය දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගෙන ගන්න අපේ රටේ ජනතාවට කිසිසේත්ම නොගැළපේ.) මෙම තත්වය අද වන විට රට තුළ විවිධ සමාජ ආර්ථික ගැටලු ඇතිවන මට්ටම දක්වා ද වර්ධනය වී ඇත. **එබැවින් ඉංග්‍රීසි ඉගැන්වීමේ නව ක්‍රමවේදයක ජාතික අවශ්‍යවයක් අප රට හමුවේ ඇති බව ඉතා පැහැදිළි ය.**



## 02. භාෂාවක තිබෙන්නේ විවිධ ස්වරූපයේ පද ගොඩාක් බවත් භාෂාවක් භාවිතා කරන්නේ වාක්‍ය වශයෙන් බවත් පෙන්වාදීම.

### භාෂාවක තියෙන්නේ දහස් ගණනක් වූ පද ගොඩක් බව.



written
priest driving be
with
rabbit will
whose
fast under that mine
regularly yourself
have easy

✓ වාහනයක විවිධ වර්ගයේ කොටස් ගොඩාක් තිබෙනවා මෙන් භාෂාවක තියෙන්නේ දහස් ගණනක් වූ පද ගොඩක්.

### භාෂාවක් භාවිතා කරන්නේ වාක්‍ය වශයෙන් බව.

✓ වාහනයක් පාවිච්චි කිරීමට නිසි කොටස් නිසි තැන්වල සවිකරලා වාහනය පණගන්වා ගත යුතුයි මෙන් භාෂාවක් ද භාවිතා කිරීමට නිසි පද නිසි තැන්වල තබා අවශ්‍ය අර්ථය ගෙනදෙන පරිදි පළමුවෙන්ම මුල් වාක්‍යයන් ගොඩනගා ගත යුතුයි.



✓ Father had been ill.
✓ You will be selected.
✓ There should be a watcher.
✓ They are to leave for Kandy.
✓ Everyone should have a job.

✓ ඉංග්‍රීසියෙන් කතා කරන්නේ, ලියන්නේ, කියවා හෝ ඇහුම්කන් දී යමක් තේරුම් ගන්නේ මෙසේ ගොඩනගාගන්නා වාක්‍ය වලිනි.

✓ වාක්‍යයක් වැරදියි කියන්නේ නිසිපද නිසි තැන්වල නැති විටයි. වාක්‍යයක් තේරෙන්නේ නැහැ කියන්නේ නිසිපද නිසි තැන්වල තබන්න දන්නේ නැහැ කියන එකයි.

## 03. ඉංග්‍රීසි ඉගෙන ගැනීමේ දී වැදගත්ම මෙන්ම සංකීර්ණම කොටස එහි පදවලින් මුල් වාක්‍යයන් ගොඩනගා ගැනීම බව පෙන්වාදීම.





- ✓ ගොඩනැගිල්ලක් ඉදිකිරීමේදී පළමුවෙන්ම එහි සැකිල්ල ඉදිකර ගැනීම අත්‍යවශ්‍යයි මෙන් ඉංග්‍රීසි භාෂාව ගොඩනගා ගැනීමේදී එහි මුල් වාක්‍යයන් පළමුවෙන්ම ගොඩනගා ගැනීම අත්‍යවශ්‍ය වේ.
- ✓ ඕනෑම අයෙකුට එක් දිනයක් හෝ ජීවත්වීමට ඉපදෙන මොහොතේ පණ ඇතිව ඉපදීම අත්‍යවශ්‍යයි මෙන් ඉංග්‍රීසි භාෂාවේ මොනයම් ම දෙයක් හෝ කිරීමට එහි මුල් වාක්‍යයන් නිවැරදිව ගොඩනගා ගැනීම අත්‍යවශ්‍ය වේ.

**<u>ඉතා වැදගත්</u>**

අපේ රටේ ඉංග්‍රීසි අධ්‍යාපනය කඩා වැටී ඇත්තේ මුල් වාක්‍යයන් ගොඩනගා ගන්නා අදියරනුයි. එවැනි කඩාවැටීමක් නොදැන පවතින ඉංග්‍රීසි ඉගැන්වීමේ ක්‍රමය යටතේ සිදු කරන්නේ,

- ✓ සැකිල්ලක් නොමැතිව ගොඩනැගිල්ලක් හදන්න උත්සාහ කරනවා මෙන් කටයුත්තක්.
- ✓ උපතේදී මැරී ඇති දරුවෙක්ව අවුරුදු 60-70 ත් ජීවත් කරවන්න හදනවා මෙන් කටයුත්තක්.

## 04. පවතින ඉංග්‍රීසි ඉගැන්වීමේ ක්‍රමය මුල් ඉංග්‍රීසි වාක්‍යයන් ගොඩනගාගැනීමට ඉගෙනගන්නා අයට උපකාර නොවන බව පෙන්වාදීම.

- ✓ තම මව් භාෂාව ඉගෙන ගැනීමේදී හා දෙවන භාෂාවක් ඉගෙන ගැනීමේදී ඕනෑම අයෙකුගේ මනස ස්වභාවිකවම ක්‍රියා කරන්නේ හාත්පසින්ම වෙනස් වූ දෙවිදිහකටයි. එබැවින් යම් ජාතියක් තම මව් භාෂාව ඉගෙනගැනීමට භාවිතා කරන ක්‍රම එම භාෂාවම දෙවන භාෂාවක් ලෙස ඉගෙන ගන්නා ජාතියකට කිසිසේතම නොගැළපේ.
- ✓ අපේ රටේ පවතින්නේ ඉංග්‍රීසි ජාතිකයින් තම මව් භාෂාව ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගෙන ගැනීමට භාවිතා කරන ක්‍රමයයි. එම ක්‍රමය දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගෙනගන්නා සිංහල ජාතිකයන්ට කිසිසේත්ම නොගැලපේ. (අන් ජාතිකයන්ට ද නොගැළපේ)
- ✓ පාසල් කාලයතුළ වසර 10 ක් පමණ, විශ්වවිද්‍යාල කාලය තුළ වසර 4 ක් පමණ හා ඉන් අනතුරුව ද තවත් වසර ගණනාවක් ඉංග්‍රීසි ඉගෙනගත්ත ද අපේ රටේ අති බහුතරයක් දෙනෙකුට ප්‍රමාණවත් ඉංග්‍රීසි දැනුමක් ලබා ගැනීමට නොහැකි වී ඇත්තේ මෙම නොගැලපීම නිසාවෙනි.



## 05. මුල් ඉංග්‍රීසි වාක්‍යයන් ගොඩනගා ගන්නා ආකාරය සිංහල වාක්‍යයන් තුළින් හඳුනාගත හැකි ක්‍රමයක් සිංහල ජාතිකයන්ට ලබාදිය යුතු බව පෙන්වාදීම.

- ✓ ඉංග්‍රීසි ඉගෙන ගන්නා සිංහල ජාතිකයෙකුට ඉංග්‍රීසියෙන් කථාකරන්න, ලියන්න, ඇහුම්කන් දී හෝ කියවා තේරුම් ගැනීමට යන ඕනෑම දෙයක් පළමුව හැඟෙන්නේ සිංහලෙන්.
- ✓ එසේ සිංහලෙන් හැඟෙන දේ තමයි ඉංග්‍රීසියට පරිවර්තනය කර කථා කරන්නේ, ලියන්නේ.
- ✓ දෙවන භාෂාවක් ඉගෙනගැනීමේදී ඕනෑම අයෙකුගේ මනස ස්වභාවිකව ම ක්‍රියාත්මක වන ආකාරය එයයි. ඕනෑම කෙනෙකුට යමක් ගැන හිතලා යමක් ගොඩනගාගැනීමේ හැකියාව (නිර්මාණශීලීභාවය) ඇති වන්නේ ද ඒ අනුසාරයෙන් පමණි.
- ✓ එබැවින් මුල් ඉංග්‍රීසි වාක්‍යයන් ගොඩනගා ගන්නා ආකාරය සිංහල වාක්‍යයන් තුළින් හඳුනාගැනීමට ක්‍රමයක් සිංහල ජාතිකයින්ට ලබාදිය යුතුය. එසේ ක්‍රමයක් නොමැති වුවහොත් අවබෝධයෙන් ඉංග්‍රීසි වාක්‍යයන් ගොඩනගා ගැනීමට අන් කිසිම ක්‍රමයක් ඔවුනට නොමැත.



## 06. පවතින ක්‍රමය යටතේ මුල් ඉංග්‍රීසි වාක්‍යයන් ගොඩනගාගන්නා ආකාරය හඳුනාගත හැකි ක්‍රමයක් සිංහල වාක්‍යයන් තුළින් කිසිසේත්ම ලබාදිය නොහැකි බව පෙන්වාදීම.

- ✓ භාෂාවක් කියන්නේ ඕනෑම වාක්‍යයක් ගොඩනගාගත හැකි විවිධ වර්ගයේ දහස් ගණනක් වූ පද ගොඩක් සහිත, ආරම්භයක්, අවසානයක්, දිගක්, පළලක්, ගැඹුරක් සොයාගත නොහැකි මහ සාගරයක් මෙන් දෙයකි.




- ✓ අපේ රටේ දැනට ඉංග්‍රීසි උගන්වන ක්‍රමය යටතේ ඉංග්‍රීසි භාෂාව මහ සාගරයක් මෙන් ඇති නිසා මුල් ඉංග්‍රීසි වාක්‍යයන් ගොඩනගා ගන්නා ආකාරය හඳුනාගැනීමට සිංහල වාක්‍යයන් තුළින් ක්‍රමයක් කිසිසේත්ම ලබාදිය නොහැක.

## 07. මුළු ඉංග්‍රීසි භාෂාවම එකවර ගොඩනගාගත හැකි ක්‍රමයක් ලබාදීමට මහ සාගරයක් මෙන් ඇති ඉංග්‍රීසි භාෂාව A4 ප්‍රමාණයේ කඩදාසි කොළයකට ගොඩනැගූ ආකාරය පෙන්වාදීම.

# මුළු ඉංග්‍රීසි භාෂාවෙම වාක්‍යයන් ගොඩනැගෙන මාවත් 05

**මුළු ඉංග්‍රීසි භාෂාව**




**Path - 01**

1.1 Ob. + (am/is/are) + p.p + by sub.
1.2 Ob. + (was/were) + p.p + by sub.
1.3 Ob. + will be + p.p + by sub.

30

**Path - 02**

2.1 Sub. + verb (sin/plu) + ob.
2.2 Sub. + verb (past) + ob.
2.3 Sub. + will + verb (plu) + ob.

45

**Path - 03**

3.1 MN + (am/is/are) + others.
3.2 MN + (was/were) + others.
3.3 MN + will be + others.

35

**Path - 04**

4.1 MN + (has/have) + others.
4.2 MN + had + others.
4.3 MN + will have + others.

16

**Path - 05**


5.1 There + (is/are) + others.
5.2 There + (was/were) + others.
5.3 There + will be + others.

16

- ✓ ජීවිත කාලය තුළ ප්‍රකාශ කරන සියලුම සිංහල වාක්‍යයන් ඉහත මාවත් 05 යටතේ ඉංග්‍රීසියෙන් ගොඩනගාගත හැකිය.
- ✓ වාක්‍යයන් ගොඩනැගෙන ආකාරයට නිසිපද නිසි තැන්වල තබා ඇති බැවින් මෙම විශ්මිත ක්‍රමය යටතේ ඉංග්‍රීසි ඉගෙන ගන්න අයට වාක්‍යයන් වැරදීමට කිසිම ඉඩක් නොමැත.

# 08. ශ්‍රී ලාංකේය අධ්‍යාපන ක්ෂේත්‍රයට පළමුවරට හඳුන්වාදෙන විස්මිත වූ ඉංග්‍රීසි ඉගැන්වීමේ ක්‍රමවේදය,

# 5 Path English Method




**යමක් කරනවායැයි හැඟෙන ක්‍රියා**

- ❖ කරනවා, කළා, කරාවි ...
- ❖ ලියනවා, ලිව්වා, ලියාවි...
- ❖ ගේනවා, ගෙනාවා, ගෙනේවි...

**යමක් කරනවායැයි නොහැඟෙන ක්‍රියා**

1. වේ, විය, වේවි...
2. ඉන්නවා, සිටියා, ඉඳීවි...
3. තියෙනවා, තිබුණා, තියේවි...

✓ සිංහල වාක්‍යයෙහි ක්‍රියාපදය එම සිංහල වාක්‍යය ඉංග්‍රීසියෙන් ගොඩනැගෙන ආකාරය පෙන්නුම් කරන ඉංග්‍රීසි පද පිළිවෙළ ඉදිරියේ තබා ඇත.

✓ ඉහත ආකාරයට මුළු සිංහල භාෂාවෙම මුල් වාක්‍යයන් ඉංග්‍රීසියෙන් ගොඩනගාගන්නා ආකාරය A4 ප්‍රමාණයේ කඩදාසි කොළයක පැහැදිළිව පෙන්වා දී ඇත.

✓ එමෙන් ම මුල් වාක්‍යයන් දෙක තුනක් එකතුවීමෙන් ගොඩනැගෙන ඕනෑම සිංහල වාක්‍යයක් ඉංග්‍රීසියෙන් ගොඩනගාගන්නා ආකාරය ද ඉහත සඳහන් A4 ප්‍රමාණයේ කඩදාසි කොළයේ ම පැහැදිළිව පෙන්වා දී ඇත.

**Let's translate the following Sinhala sentences into English under 5 Path English Method.**
**5 Path English Method.යටතේ පහත සිංහල වාක්‍යයන් ඉංග්‍රීසියට පරිවර්තනය කරමු.**

01. වහු පැටියා එළදෙන ළඟ ඉන්නවා. — වහු පැටියා - calf / එළදෙන ළඟ - near the cow

..........

02. වහු පැටියෙක් එළදෙන ළඟ ඉන්නවා. — වහු පැටියෙක් - a calf / එළදෙන ළඟ - near the cow

..........

03. එළදෙනට පැටියෙක් ඉන්නවා. — එළදෙන - cow / පැටියෙක් - a calf

..........

04. ව්‍යාපෘතිය ලාභදායක වේ. — ව්‍යාපෘතිය - project / ලාභදායක - profitable

..........

05. ගම්වාසීන් උත්සවය සංවිධානය කරාවි. — ගම්වාසීන් - villagers / උත්සවය - festival / සංවිධානය ක. - organize

..........

06. උත්සවය සංවිධානය කරාවි. — උත්සවය - festival / සංවිධානය ක. - organize+d

..........

07. ඔවුන්ට තුවක්කුවක් තිබුණා. — ඔවුන් - they / තුවක්කුවක් - a gun

..........

08. තුවක්කුව ඔවුන් ළඟ තිබුණා. — තුවක්කුව - gun / ඔවුන් ළඟ - with them

..........

09. තුවක්කුවක් ඔවුන් ළඟ තිබුණා. — තුවක්කුවක් - a gun / ඔවුන් ළඟ - with them

..........

10. ඉංග්‍රීසි ගොඩක් ලේසි වේවි. — ගොඩාක් ලේසි - very easy

..........

11. වෙළෙන්දන් විසින් නිතර බඩු විකුණනවා. — වෙළෙන්දන් විසින් - by the traders / විකුණනවා - sell/sold / බඩු - goods

..........

12. වෙළෙන්දන් නිතර බඩු විකුණනවා. — වෙළෙන්දන් - traders / විකුණනවා - sell / නිතර - always / බඩු - goods

..........

13. හඳට හාවෙක් සිටියා. — හඳ - moon / හාවෙක් - a rabbit

..........

14. හඳේ හාවා සිටියා. — හාවා - rabbit / හඳේ - in the moon

..........

15. හාවෙක් හඳේ සිටියා. — හාවෙක් - a rabbit - හඳේ - in the moon

..........

16. ඔහු ආඩම්බර විය. — ඔහු - he / ආඩම්බර - proud

..........

17. සංවිධායකවරු ඊයේ තරගය පැවැත්වූවා. — සංවිධායකවරු - organizers / තරගය - match / පවත්වනවා - hold / held

..........

18. ඊයේ තරගය පැවැත්වූවා. — ඊයේ - yesterday / තරගය - match / පවත්වනවා hold / held


..........

19. ගුරුවරයා පංතියේ සිටියා. — ගුරුවරයා - teacher / පංතියේ - in the class

..........

20. ගුරුවරයෙක් පංතියේ සිටියා. — ගුරුවරයෙක් - a teacher / පංතියේ - in the class

..........



# Candle in the Wind
## (සුළඟේ දැල්වුණු ඉටි පහන්සිළ)

Goodbye England's rose
May you ever grow in our hearts
You were the grace that placed itself
Where lives were torn apart
You called out to our country
And you whispered to those in pain
Now you belong to heaven
And the stars spell out your name

And it seems to me you lived your life
Like a candle in the wind
Never fading with the sunset
When the rain set in
And your footsteps will always fall here
Along England's greenest hills
Your candle's burned out long before
Your legend ever will

Loveliness we've lost
These empty days without your smile
This torch we'll always carry
For our nation's golden child
And even though we try
The truth brings us to tears
All our words cannot express
The joy you brought us through the years

From a country lost without your soul
Who'll miss the wings of your compassion
More than you'll ever know

And it seems to me you lived your life
Like a candle in the wind

- Elton John, Billy Joel -

# Pappas' Story - Part 01




| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| another uproar | - තවත් ගාලගෝට්ටියක් | my back | - මගේ කොන්ද | what happened | - මොනවද වුණේ | destroy | - විනාශ කරනවා |
| troops | - හට කණ්ඩායම් | paining | - වේදනා ගෙනදෙනවා | fine | - කදිමයි | everything | - සෑම දෙයක්ම |
| play a havoc | - පිස්සුවක් නටනවා | what is going on | - මොනවද වෙන්නේ | proper time | - නියම වෙලාව | hit | - ගහනවා |

# THE LION KING



Zazu



Simba



Nala



Rafiki



Mufasa (King)



Timon



Sarabi (Queen)



Pumbaa



Scar



Hyenas

# GULLIVER'S TRAVEL - PART 01



My father had some land in the North of England, but it was not very much, and I was the youngest of five brothers. I left school when I was seventeen years old, because my father could not pay for me after that. Then after I went to the ship Antelope, under Captain Pritchard in May 1752 and at first we had an easy time.

I will not write down everything happened to us in those seas. On our way to the East Indies, a huge gale carried us the wrong way. So we came to the North of Van Diemen's Land. Twelve of our men had died of hard work and bad food, and of the rest, none was very strong.

| | | | | | |
|---|---|---|---|---|---|
| **some land** | - | ඉඩම් ටිකක් | **happened** | - | සිදුවුන |
| **very much** | - | ගොඩක් | **those seas** | - | ඒ මුහුදු |
| **youngest** | - | බඩපිස්සා | **on our way** | - | අපි යන මාර්ගයෙ |
| **left** | - | හැරගියා | **a huge gale** | - | විශාල චණ්ඩමාරුතයක් |
| **because** | - | මක්නිසාද යත් | **carried** | - | රැගෙන ගියා |
| **pay** | - | ගෙවනවා | **wrong way** | - | වැරදි මාර්ගය |
| **after that** | - | ඉන් පසුව | **East Indies** | - | නැගෙනහිර ඉන්දියානු කලාපය |
| **then after** | - | ඉන් අනතුරුව | **hard work** | - | අමාරු වැඩ |
| **at first** | - | පළමුව | **bad food** | - | නරක ආහාර |
| **an easy time** | - | පහසු කාලයක් | **rest** | - | ඉතිරිය |
| **write down** | - | ලියා දක්වනවා | | | |